# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,263 — 1962 අගෝස්තු 17 වැනි සිකුරාද — 1962.8.17**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් ශාඛාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම:— | — |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 519 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 528 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1962 අංක 384 දරන ආඥාව

යොමු අංකය : ජේ 59/60 පී 369—ඇල්. එච්/ සී 369.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 අගෝස්තු මස 9 වැනි දින,
කොළඹ.

#### උපලේඛනය

| I | II |
|---|---|
| ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා | ඉඩමේ විස්තරය |
| කළුතර දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක් | පහත සඳහන් අන්දමට මායිම් වී ඇති, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ, ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ නාගොඩ ගම් මූලාදෑනි වසමේ, නාගොඩ ගමේ පිහිටි, අ. 5, රූ. 3 ක් පමණ ප්‍රමාණය ඇති fපුලර්ටන් වත්ත නමැති ඉඩම් කොටස :— උතුරට : රජයට ගෙන ඇති මෙම ඉඩමේම කොටසක්; නැගෙනහිරට: දෙපා ඇල ; බස්නාහිරට : කළුතර-මතුගම ප්‍රසිද්ධ පාර ; දකුණට : අත්කර ගනු ලබන ඉඩමේම ඉතිරි කොටස. |

8-737—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1962 අංක 341 දරණ ආඥාව

යොමු අංකය: ජේ 61/62 එල්ජී 122.
ඇල්. ඞී/ඞී 98 (ඞී-ජීඅයි 48/3).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 ජූලි මස 19 වන දින.

### උපලේඛනය

**I — ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා**

මහනුවර දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියා.

**II — ඉඩමේ විස්තරය**

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඉහළමුල්ල ගම්මුලාදෑනි වසමේ ඉහළ මුල්ල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 05 ක් පමණ වූ අන්කුඹුර වතුයායේ බිම් කට්ටි දෙකකට මායිම්:—

**බිම් කට්ටි අංක 1—අන්කුඹුර වතුයාය උඩ කොටස 5 වෙනි ක්ෂේත්‍රය**

උතුරට: එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: අන්කුඹුර වතුයායේ පාර; දකුණට: උඩවත්තාදෙණිය ඇළ; බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස.

**බිම් කට්ටි අංක 2—අන්කුඹුර වතුයායේ උඩ කොටස 6 වෙනි ක්ෂේත්‍රය**

උතුරට: උඩවත්තාදෙණිය ඇළ; නැගෙනහිරට: අන්කුඹුර වතුයායේ පාර; දකුණට සහ බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස.

8-494—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1962 අංක 343 දරණ ආඥාව

යොමු අංකය: ජේ 58/59ජී651—එල්. එච්. 5799.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 ජූලි මස 18 වන දින.

### උපලේඛනය

**I — ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා.**

දිස්ත්‍රික් ඉඩම් නිලධාරි කෑගල්ල දිස්ත්‍රික්කයේ, හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියා.

**II — ඉඩමේ විස්තරය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුළුගම සහ පනාවල දෙකෝරළේ ආදායම් කොට්ඨාශයේ තල්දූව වසමේ ඉහළ තල්දූව ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 1 රූ. 2 ප. 28 ක් පමණ වූ ගොඩපින්නේ හේනයායේ ආංමාරිස් වවපුවත්ත නොහොත් කජුගහවත්ත නමැති ඉඩමට මායිම්:

උතුරට: ඒ. විලියම් සිංඤෝ හිමිකම් කියන ගලබොඩවත්ත සහ ආර්. ජී. එස්. විමලසේන හිමිකම් කියන ලේකම්ලාගේ වත්ත; නැගෙනහිරට: රජය සතු ඉහළ තල්දූව පාසල් භූමිය; දකුණට: ඩබ්ලිව්. බී. එන්. මිටෝ සහ තවත් අය හිමිකම් කියන ආචාරිගෙවත්ත සහ පී. ඒ. බී. සයිමන් පදිංචි ගෙය පිහිටා ඇති මෙම ඉඩමේ ම කොටසක්; බස්නාහිරට: ආර්. ඒ. සිවරත් නම් හිමිකම් කියන ගොඩපින්නේ හේන්යායේ වත්ත.

8-495—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1962 අංක 342 දරණ ආඥාව

යොමු අංකය: ජේ. 61/62 එල් 342 (වීඊ)—කිව්ඞී—125.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ජූලි මස 19 වන දින,
කොළඹ.

### උපලේඛනය

**I — ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති, නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා**

කොළඹ දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගේ බලය ලත් වෙනත් නිලධාරියා.

**II — ඉඩමේ විස්තරය**

කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑ කෝරළේ (මැදපත්තුවේ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, නෑදුන් ගමුවේ පිහිටි පහත සඳහන් මායිම් තුළ ඇති අක්කර 5ක් පමණ වූ රබුටන්ගහවත්ත නමැති ඉඩම:—

උතුරට: ඇම්. ඇම්. ඇම්. බයස් සහ තව අය අයිතිකම් කියන මිල්ලගහවත්ත; නැගෙනහිරට: බියගම-මුදුන්ගොඩ ප්‍රසිද්ධ පාර; දකුණට: ඇඹරළුවට ඇති කරත්ත පාර; බස්නාහිරට: බී. ඇම් දනියෙල් අප්පුහාමි අයිතිකම් කියන පිඹියගහවත්ත.

8-497—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

ඇල්. එච්./සී/40/60.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡෙදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ **5** වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ ආදායම් පාළක කොටසේ, අදිකාරි පත්තුවේ, මැදගම ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 0 ක් පමණ වූ කිතුල්ගහවත්ත නම් ඉඩම් කැබැල්ලට මායිම් :

උතුරට : ඇලිස් අමරසිංහ මහත්මිය සහ තවත් අය හිමිකම් කියන ඉද්දගහවත්ත නම් ඉඩම (රජයට ගැනීමට අදහස් කර ඇති ඉඩම) සහ මැදගම මර්තේනිස් අමරසිංහ සහ තවත් අය හිමිකම් කියන කනත්තෙවත්ත නම් ඉඩම ; නැගෙනහිරට : මැදගම කේ. ඩී. ඇස්. විජේවර්ධන මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ම කොටසක් ; දකුණට : කේ. ඇල්/මැදගම රජයේ පාසල් වත්ත ; බටහිරට : මැදගම මර්තේනිස් අමරසිංහ මහතා සහ තවත් අය හිමිකම් කියන කනත්තෙවත්ත නම් ඉඩම.

2. කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ ආදායම් පාළක කොටසේ, ආදිකාරි පත්තුවේ, මැදගම ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, ප. 0 ක් පමණ වූ ඉද්දගහවත්ත නම් ඉඩම් කැබැල්ලට මායිම් :

උතුරට : ගම්මන්පිල බුද්ධදාස අමරසිංහ සහ තවත් අය හිමිකම් කියන ඉද්දගහවත්ත නම් ඉඩම (ගැනීමට අදහස් කර ඇති ඉඩම) සහ කරත්ත පාර ; නැගෙනහිරට : ඇලිස් අමරසිංහ මහත්මිය සහ තවත් අය හිමිකම් කියන මෙම ඉඩමේ ම ඉතිරි කොටස ; දකුණට : මැදගම කේ. ඩී. එස්. විජේවර්ධන මහතා හිමිකම් කියන කිතුල්ගහවත්ත නම් ඉඩම (ගැනීමට අදහස් කර ඇති ඉඩම) ; බටහිරට : මැදගම මර්තේනිස් අමරසිංහ මහතා සහ තවත් අය හිමිකම් කියන කනත්තෙවත්ත නම් ඉඩම සහ කරත්ත පාර.

3. කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, ආදායම් පාළක කොටසේ, අදිකාරි පත්තුවේ, මැදගම ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 0 ක් පමණ වූ, ඉද්දගහවත්ත නම් ඉඩම් කැබැල්ලට මායිම් :

උතුරට : මැදගම සුබසිංහගේ හෝරැස් සිඤ්ඤෝ මහතා සහ තවත් අය හිමිකම් කියන ඉද්දගහවත්ත නම් ඉඩම සහ කරත්ත පාර ; නැගෙනහිරට : බුද්ධදාස අමරසිංහ සහ තවත් අය හිමිකම් කියන මෙම ඉඩමේ ම ඉතිරි කොටස ; දකුණට : ඇලිස් අමරසිංහ සහ තවත් අය හිමිකම් කියන ඉද්දගහවත්ත නම් ඉඩම (ගැනීමට අදහස් කරන) ; බටහිරට : කරත්ත පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 59/60 ඊ. 710කේ—ඇල්. එච්./සී/40/60.
1962 ජූලි මස 18 වන දින,
කොළඹ දී ය.

8-676—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥව**

**1962 අංක 344 දරණ ආඥව**

යොමු අංකය : ජේ. 58/59 ඊ 482—ඉට 3/184.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තිරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 ජූලි මස 18 වන දින.

### උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| ගාල්ල දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක්. | ගාල්ල දිස්ත්‍රික්කයේ, බටහිර ගබන්තොට වලල්ලාවිටි කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අහුන්ගල්ල ගම්මුලාදැනි වසමේ, අහුන්ගල්ල නමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 0, රූ. 1, පර්. 20 ක් පමණ වන පිංවත්ත නමැති ඉඩමට මායිම් :— උතුරට : ලොරා විජයරත්න මහත්මිය සහ තවත් කෙනෙක් හිමිකම් කියන වෙදඑන්ද පදිංචි වත්ත ; නැගෙනහිරට : රජය සතු කළුත ් දිදෝරිස් පදිංචිවත්ත සහ පරගෙදහිකිරියා පදිංචි උත්වත්ත ; දකුණට : පිරිජනම්මගෙ වත්ත නොහොත් උතුකටුගෙදර වත්ත නොහොත් කුඩාමුනිගෙදරවත්ත ; බටහිරට : අගම්පොඩි අමොරිස් තාබාා ගේ වත්ත සහ මිතිමුත්තගේ වත්ත. |

8-496—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡෙදය)

**38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥව**

**1962 අංක 345 දරණ ආඥව**

යොමු අංකය : ජේ 61/62 එල්. 133 (වීරී)—3/40/233.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ජූලි මස 18 වන දින,
කොළඹ.

### උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| මාතලේ දිස්ත්‍රික්කයේ දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක් | මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කඹුවෙල ගම්මුලාදැනි කොටසේ, කඹුවෙල ගමේ පිහිටි බෙන්වියුලාවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 5, රූ. 1, ප. 0ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළවූ කොටස :— උතුරට : මල්ලිකා කුමාරිහාමි සහ තවත් අය අයිතිකම් කියන ගොඩමඩේ වත්ත සහ පී. බී. ස්වර්න පාල සහ තවත් අය අයිතිකම් කියන බෝගහමුලවත්ත 2 වැනි ඉඩම් ; නැගෙනහිරට : බන්ඩාර අමුණ ඇල ; දකුණට : නානායක්කාර අයිතිකම් කියන එම ඉඩමේ කොටස ; බස්නාහිරට : එම ඉඩමේ කොටස සහ ලෑලිඅඹේ සිට කඹුවෙල දක්වා ඇති ප්‍ර. වැ. දෙපාර්තමේන්තුවේ පාර. (ඇස්. ඇම්. අබ්දුල් කාඩර් හිමිකම් කියන සුළු කොටස් දෙකක් අත්හැර). |

8-498—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥව**

### 1962 අංක 378 දරණ ආඥව

යොමු අංකය : ජේ 61/62එල් 405 (වීඊ)-එල්එල්ඒ. 6671.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමින්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 අගෝස්තු මස 4 වන දින,

### උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| රත්නපුර දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක් | රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ, කුඩාබාගෙ බටහිර බඹර බොටුව ගම් මුලාදෑණි වසමේ දැහැන කන්ද ගමේ පිහිටි හපුගස්තැන්න ආදී ඉඩම්වලින් (401 දරණ අ. ග. සැ. අංක 28 දරණ ඉඩම් කැබැල්ලෙන් කොටසක්) පහත සඳහන් මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 25 ක් පමණ වූ ඉඩම් කොටසක්— <br><br> උතුරට : රත්ගගේ රක්ෂිත බිම් තීරුවේ කොටසක් (401 දරණ අ.ග.සැ. අංක 11 දරණ ඉඩම් කැබැල්ල) ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : මෙම ඉඩමේ ම ඉතිරි කොටස සහ බණ්ඩාරවත්ත ඇළේ කොටසක් (401 දරණ අ.ග. සැ. අංක 19 දරණ ඉඩම් කැබැල්ල); බටහිරට : රත්ගගේ රක්ෂිත බිම් තීරුවේ කොටසක් හපුගස්තැන්න වත්ත (401 දරණ අ.ග.සැ. අංක **12**, 13, 14, 17 සහ 18 දරණ **ඉඩම්** කැබලි) සහ දිය ඇල. (401 දරණ අ.ග.සැ. අංක 16 දරණ **ඉඩම්** කැබැල්ල). |

8-521—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ගාළු දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, යටලමත්ත ගම්මුලාදෑනි වසම තුල යටලමත්ත ගමේ පිහිටි, අංක ඒ. 1501 දරණ මූලික සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් හැඳින්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 07.3 ක් වන පහත සඳහන් මායිම් තුල වූ රුක්මල්ගොඩ ඕවිට නමැති ඉඩම් කැබැල්ල.

උතුරට සහ බටහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : ගාළු-ඇතුමලේ පී. ඩබ්ලිව්. ඩී. පාර ; දකුණට : ගොඩවානේ සිට වැටී ඇති ගම්සභා පාර.

අත්සන් කළේ : සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ 61/62 ඇල්ජී. 246—ඉට/1/208.
1962 ජූලි මස 19 දින, කොළඹ දීය.

8-581—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ සහ කිණිගොඩ දෙකෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, ගල්බඩ කෝරළේ සිඟුල සහ ඒදඹුවාව නමැති වසම් තුළ, මාවාන සහ කෝන්ගමුව නමැති ගම් වල පිහිටි කොට්ටවත්ත නොහොත් මුතුපාන්ගොඩවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 4 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :—

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටසක්, ගැනීමට යෝජනාකර ඇති කොටසක් අතර ඇති මලදොල ; නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : ඕ. ඇම්. සාපියා උම්මා හිමිකම් කියන ඉඩම ; බස්නාහිරට : මාවනැල්ල-හෙම්මාතගම ප්‍රසිද්ධ පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ 60-61 එල්ජී 440.
1962 ජූලි මස 28 දින කොළඹදීය.
8-510—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

අංක : එල්එල්/ඒ 6281

ජේ 57/58 ඊ 542

## ඉඩම් ලබාගැනීමේ ආඥපනත (460 පරිච්ඡේදය)

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

**රත්නපුර දිස්ත්‍රික්කයේ**, කුරුවිට කෝරළේ, වලවිට ගම්මුලාදෑනි කොට්ඨාශයේ, වලවිට ගමේ පිහිටි අංක 706 දරණ ග : සි : 1 වැනි උද්ඝෘතයේ ලොට් 272 වශයෙන් මැන විස්තර කරන පහත සඳහන් ඉඩම.

**ලොට් 272.**

ඉඩමේ නම : කජුගස්වත්තෙහේන ; විස්තර : අවුරුදු 2—7 දක්වා වයසැති රබර් ගස් 31 ක්ද, අවුරුදු 12—15 දක්වා වයසැති කොස් ගස් 8 ක්ද, අවුරුදු 8 ක් වයසැති තැඹිලිගසක්ද, අවුරුදු 5 ක් වයසැති දෙල්ගසක්, අඹගසක් සහ දොඩම් ගසක්ද, අවුරුදු 10 ක් වයසැති කජුගසක්ද, බඳින ලද වැසිකිළියක්ද, වතුර ටැන්කියක කොටසක්, තාවකාලික ගොඩනැගිල්ලක් හා නිත්‍ය ගොඩනැගිලි දෙකකද කොටස් ඇති රබර් සහ ගෙවත්ත, (ඉඩම් අයිතිකරුවන් විසින් වවනලද රබර්, ගෙවතු වැවිලි සහ ගොඩනැගිලි අධ්‍යාපන දෙපාර්තමේන්තුවේය.) : අයිතිවාසිකම් කියන අය : කඩවත "fපරුවී ගොරොව්"හි පදිංචි සීලා ගුණතිලක මහත්මිය, හා කොළඹ අංක 98 දරණ දකුණු ස්කිනර්ස් පාරේ පදිංචි ඇන්. ඇම්. ලයි මහතා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 39.9.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ඔක්තෝබර් මස 8 වැනි දින පෙරවරු 10.30 ට රත්නපුර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1962 සැප්තැම්බර් මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම හෝ බුක්ති විශෙෂය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වු) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇම්. ඒ. මොහමඩ්,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා,

වර්ෂ 1962 ක්වූ අගෝස්තු මස 10 දින,
රත්නපුර කච්චේරියේ දීය.

8-653—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

ඇල්.එච්./සී./53/61.

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, මුංහේන ගම් මුලාදැනි වසමේ, මුංහේන ගමේ පිහිටි අක්කර 27 ක් පමණ විශාලවූ බුබුලලන් ද වත්ත නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම.

උතුරට : ඊ. ඒ. ජී. ද සිල්වා හා තවත් අයට අයත් මෙම ඉඩමේම කොටසක් හා ඇම්. ඇස්. ඇම්. මොහමදු හා තවත් අයට අයත් කරඳගහ කුඹුර නොහොත් පහල වෙල්යාය; නැගෙනහිරට : ඇම්. ඇස්. ඇම්. මොහමදු සහ තවත් අයට අයත් කරඳගහ කුඹුර නොහොත් පහල වෙල්යාය හා මාරියමුත්තු නාච්චි හා තවත් අයට අයත් කරඳගහවෙල නොහොත් බටේදෙනිය කුඹුර; දකුණට : මාරියමුත්තු නාච්චි හා තවත් අයට අයත් කරඳගහවෙල නොහොත් බටේදෙනිය කුඹුර හා බී. සිසිලියා පෙරේරා හා තවත් අයට අයත් පිස්සාහේන කුඹුර; බටහිරට : බී. සිසිලියා පෙරේරා හා තවත් අයට අයත් පිස්සාහේන කුඹුර හා ඊ. ඒ. ජී. ද සිල්වා හා තවත් අයට අයත් මෙම ඉඩමේම කොටසක්.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ 61/62 එල් 46 (වී.ඊ)—ඇල්.එච්/සී/53/61.
1962 ජූලි මස 10 දින, කොළඹ දීය.

8-580—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත(460 වෙනි පරිච්ඡේදය)

### 5 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම/පරවශතාව මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

මහනුවර, දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, ඉහළමුල්ල ගම් මුලාදැනි වසමේ ඉහළ මුල්ල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 05 ක් පමණ වූ අනුකුඹුර වතුයායේ බිම්කට්ටි දෙකකට මායිම් :—

**බිම්කට්ටි අංක 1—අත්කුඹුර වතුයාය උඩ කොටස—5 වෙනි ක්ෂේත්‍රය.**
උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට : අත්කුඹුර වතුයායේ පාර; දකුණට : උඩවත්තාදෙනිය ඇල; බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

**බිම් කට්ටි අංක 2—අත්කුඹුර වතුයායෙ උඩ කොටස—6 වෙනි ක්ෂේත්‍රය**
උතුරට : උඩවත්තාදිය ඇල; නැගෙනහිරට : අත්කුඹුර වතුයායේ පාර; දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

සඳහන් අංකය : ජේ. 61/62 එල්ජී 122—එල්සී/සී/98.
1962 ජූලි මස 19 දින,
කොළඹ දීය.

8-670—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මඩකලපු දිස්ත්‍රික්කයේ දකුණු මාන්මුණේ සහ එරුවිල් පෝරතිව් පත්තුවේ කෝට්ටෙයිකල්ලාර් නමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 1ක් පමණ වූ විසුවාලිංගම්, ගෝනමදාස, මාරිමුත්තු, මුරුගේසන්, සින්නපිල්ලෙයි සහ කන්දයියා යන අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඒකාබද්ධ ඉඩම් කැබලි 6 කට මායිම් :—

උතුරට : කනපතිපිල්ලෙයි සහ පී. තම්බිපිල්ලෙයි යන අය හිමිකම් කියන ඉඩම්; නැගෙනහිරට : මඩකලපුවේ සිට කල්මුනේට ප්‍රසිඛ පාර; දකුණට : කොඩ්ඩෙයිකල්ලාර් පාසල් ඉඩම සහ පටු මාවත; බස්නාහිරට : වී. සෙල්ලයියා, ඇම්. සින්නපිල්ලෙයි සහ අලගම්මා මහත්මිය හිමිකම් කියන ඉඩම්.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 57/58 ඊ 756.
1962 ජූලි මස 10 වැනි දින,
කොළඹදී ය.

8-672—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් ලබාගැනීමේ ආඥාපණත (460 වෙනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය : ආර්/කිව්. 330.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්ම ඒ. 4,991. පිහිටීම : කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරී තැනගේ කොට්ඨාශයේ කොලොන්නාව නගර සභා සීමාව තුළ ඡන්ද කොට්ඨාශ අංක 7, වේරගොඩ.

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : ගොරදෙහිපිටිය පාරේ වරිපනම් අංක 6 කොටසක්, පරණ වාඩියවත්ත; විස්තරය : කොන්ක්‍රීට් දා, තනා ඇති ඇලක් ද, කෙසෙල් පඳුරු 2 ක් ද, තාවකාලික එලවලු කොටු 2 ක් ද, ඇතුළත් තණ පිට්ටනිය; අයිතිකම් කියන අය : කොළඹ, 5 ළවනි හරස් වීදියේ අංක 105 පදිංචි ඇම්. මුත්තයියා පිල්ලේ; ප්‍රමාණය : අ. 0, රූ. 1, පර්. 05.4.

**කැබැල්ල : 2.**

ඉඩමේ නම : ගෙරදෙහිපිටිය පාරේ වරිපනම් අංක 7 කොටසක්, සියඹලා ගහවත්ත; විස්තරය : කොන්ක්‍රීට්දා, තණන ලද ඇලක් ද, තාවකාලික එලවළු කොටු ඇතුළත් තණ පිට්ටනිය; අයිතිකම් කියන අය : කොළඹ, කොල්ලුපිටිය, "නුරානි විලා" හි පදිංචි එච්. ඩී. ප්‍රනාන්දු; ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 19.2.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 නොවැම්බර් 6 වැනි දින පූ. භා. 11.30 ට කොළඹ, කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 ඔක්තෝබර් 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. මේ සම්බන්ධයෙන් අයිතිවාසිකම් තහවුරුකිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

වී. පී. ඒ. පෙරේරා,
ආණ්ඩුවේ අතිරේක ඒජන්තතැන,
කොළඹ දිස්ත්‍රික්කය.

1962 අගෝස්තු 7 වැනි දින,
කොළඹ කච්චේරිය.

8-618—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙසින් ප්‍රකාශ කරමි:

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ හා පාත බුලත් ගම ප්‍රාදේශීය ආදායම් පාලක කොට්ඨාශයේ නෙළුවක්කන වසමේ දේදුගල ගමේ පිහිටි, ගනේගොඩලන්ද මූකලාන නම් ඉඩමෙන් අක්කර එකක් පමණ විශාලත්වය ඇති බිම් කොටස :—

උතුරට, දකුණට සහ බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස;
නැගෙනහිරට: දේදුගල-උඩුව ගම්සභා පාර හා පාඨශාලා ක්‍රීඩා භූමිය..

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ58/59ඊ, 861/එල්එම් 5827.

1962 ජූලි මස    දින,
කොළඹ දී ය.

8-563—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ලබාගැනීමේ ආඥාපණත (460 පරිච්ඡේදය)

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

අංකය: කිව්. සී. 117

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූ. සැ. අංක ඒ. 4923—ගම: සබරලුව, බටහිර සියනෑකෝරළේ අදිකාරි පත්තුව, කොළඹ දිස්ත්‍රික්කය

**කැබලි අංකය: 1.**

ඉඩමේ නම: අබනේවත්ත; විස්තර: අවුරුදු 20ක් පැරණි පොල් ගස් 4ක් හා අවුරුදු 20ක් පැරණි කජුගසක් ඇති ඉඩම; අයිතිකම් කියන අය: හනීෆ්පා ලෙබ්බේ මොහමදු අබ්දුල් හසන්, නිව් මුස්ලිම් බේකරිය, කිරිදිවැල; ප්‍රමාණය: අ. 0, රූ. 3, ප. 22.1.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 සැප්තැම්බර් මස 8 වැනි දින පූ. භා. 9ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අගෝස්තු 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

බී. රාජරත්නම්,
කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි තැන.

1962 අගෝස්තු මස 6 වැනි දින,
කොළඹ කච්චේරිය.

8-549—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## අංක 460 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

සඳහන් අංකය: ඉට/2/22

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව අංක 460 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් දන්වා සිටිමි.

ගම් පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

1960 නොවැම්බර් 25 වැනි දින අංක 12,235 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමති තුමා විසින් පළ කරන ලද අංක ජේ.59/60 ඇල්. 15 (වීඊ) ප්‍රකාශනයෙන් තීරණය කළ පරිදි,

ප්‍රා. ආ. නි. කොට්ඨාශය: කඩවත් සතර ගම්පති වසම: ගනේගොඩ. ගම: ගනේගොඩ; පිඹුරු අංකය: ඒ. 1962 දරණ මූලික සැලැස්ම

**කැබලි අංකය: 1.**

ඉඩමේ නම: රජමූකලානවත්ත; විස්තරය: තේ, රබර් සහ පොල් සහිත ඉඩම; ප්‍රමාණය: අ. 17, රූ. 1, ප. 15.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවක් ඇති සියලු දෙනාම ඔවුන් ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 සැප්තැම්බර් මස 24 දින ප. ව. 3.30 ට ගාල්ලේ, දිසාපති කාර්යාලයේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙසින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේ දී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1962 සැප්තැම්බර් 18 වන දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයි ද නියම කරමි.

අංක ඒ 1962 දරණ මූලික සැලැස්මේ පිටපතක් බලාගැනීම පිණිස ගනේගොඩ ගම්පතිගේ කාර්යාලයේ තැන්පත් කර ඇත.

අ. සි. නවරත්න රාජා,
ගාල්ලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

ගාල්ලේ කච්චේරිය.
1962 අගෝස්තු මස 10 දාය.

8-579—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## අංක 12 දරණ කාණ්ඩයේ 460 වැනි පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් අංක 12 දරණ කාණ්ඩයේ 460 වැනි පරිච්ඡේදය ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර—

රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන්කෝරළේ උඩපත්තුවේ බෝපිටිය ගමේ පිහිටි අංක 197 දරන අ. ග. සි. 3 වෙනි අතිරේකයේ මැණ විස්තර කරණ පහත සඳහන් ඉඩම :—

**ලොට්: 318.**

ඉඩමේ නම: පරවිකුඹුර; ඉඩමේ විස්තර: අවුරුදු 5-20 දක්වා වයසැති පොල්ගස් 13 ක්ද, අවුරුදු 5-20 දක්වා වයසැති කොස්ගස් 5 ක්ද, අවුරුදු 5-20 දක්වා වයසැති දෙල්ගස් 3 ක්ද, අවුරුදු 5-20 දක්වා වයසැති පුවක් වැවිල්ලක්ද සහ වරිච්චි බිත්ති ඇති පොල් අතු සෙවිලිකළ ගොඩනැගිල්ලද් ඇති ගෙවත්ත; අයිතිවාසිකම් කියා සිටින අය: ඩබ්. ඩබ්. ටී. ඇම්. ටිකිරිකුමාරිහාමි, මල්වල පාර හන්දිය සහ ආර්. අන්ගම්මන අංක 6, ඇතුල් රවුම්පාර, රත්නපුර: ප්‍රමාණය: අ. 1, රූ. 3, ප. 05.0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ඔක්තෝබර් මස 3 වෙනි දින උදේ 10 ට රත්නපුර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1962.9.25 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**සැලකිය යුතුයි.**—ඉහත සඳහන් අත්කර ගැනීමට සම්බන්ධ සියළු ඔප්පු ආදිය මෙම විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇම්. ඒ: මොහමඩ්,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

1962 ක්වූ අගෝස්තු මස 6 වැනි දින,
රත්නපුර කච්චේරියේදීය.

8-518—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පණත (460 වෙනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය. එල්. බී/2440.

මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම රජයට අත්කර ගැනීමට අදහස් කරන බව ඉඩම් අත්කර ගැනීමේ පණතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:

සැලැස්ම අංකය ඒ 1,904 දරණ මූලික සිතියම

පහත සඳහන් ඉඩම, මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුව සහ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ දික්වැල්ල දකුණ ගම්මුලාදෑනි වසමේ, දික්වැල්ල දකුණ ගමෙහි පිහිටා ඇත.

**කැබැලි අංකය : 1.**

ඉඩමේ නම : කෝන්දෙනිය වත්ත; ඉඩමේ විස්තර: බඳින ලද ළිං 3 ද, නොබැඳි ළිං 1 ද, බැඳසාදා උළු සෙවිලි කළ ගෙයක් ද, සින්ක් තහඩු සෙවිලි කළ ගරාජයක් ද, සින්ක් තහඩු සෙවිලි කළ වැසිකිළි 2 ද, සින්ක් තහඩු සෙවිලි කළ මැටියෙන් බැඳි මඩුවක් ද, සින්ක් තහඩු සෙවිලි කළ කුකුල් කුඩුවක් ද, අතු සෙවිලි කළ තාවකාලික මඩු දෙකක් ද, අත්හරින ලද බැඳසාදා උළු සෙවිලි කළ ගෙයක් ද, මැටියෙන් තනා අතුසෙවිලි කළ ගෙයක් සහ පාරකින් ද, යුතු අවුරුදු 30 කට වැඩි පොල් වගාව ඇති ඉඩම; අයිතිකරුවන්ගේ නම් සහ ලිපින: කොළඹ, වරව් පාරේ 47, ඒ. එෆ්. විජේමාන්න; පානදුර මැදකුඹුරේ, "හරිලන්ඩ්ස්" හි ඊ. ජේ. විජේමාන්න,, නුවර, පේරාදෙනිය පාරේ, 412, සාරා එතල් සෙනෙවිරත්න හෙවත් විජේමාන්න මහත්මී, කළුතර, උතුරු කළුතර, සිරි සුමංගල පාරේ, "සිරි නිවසේ", ෆ්ලොරන්ස් මේබල් විජේසේකර හෙවත්, විජේමාන්න මහත්මී; ප්‍රමාණය: අක්. 23, රූ. 1, පර්. 06.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවයන් ඇති සියළු දෙනාම ඔවුන්ම හෝ, ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් හෝ, 1962 සැප්තැම්බර් මස 10 වැනි දින පස්වරු 3.00 ට මාතර දිසාපති කාර්‍යාලයේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තව ද, ඉඩම පිළිබඳ සම්බන්ධතාව ද එම ඉඩම පවරා ගැනීමේ දී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද, 1962 සැප්තැම්බර් මස 1 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුතු දැන්වීමකින් ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලියවිල්ලකින් බලය ලත් නියෝජිතයන් හෝ මට ලියා දන්විය යුතුයැයි ද, නියම කරමි.

පරීක්ෂණයේ දී තමාම හෝ තමන් වෙනුවෙන් පෙනී සිටීමට ලියවිල්ලකින් බලය ලත් නියෝජිතයෙකු හෝ එසේ පෙනී සිටිමින් ඉඩමට අයිතිය ඔප්පු කිරීමට ඔප්පු තිරප්පු ඉදිරිපත් කළ යුතුයි.

ප්‍රා. සී. පීටර්ස්,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මාතර දිස්ත්‍රික්කය.

1962 අගෝස්තු මස 7 වැනි දින,
මාතර දිසාපති කාර්‍යාලයේ දී ය.

8-612—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

එල්එල්/ඒ 5512

ජේ එල් එල් සී 2634

## ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළයේ පල්ලේ පත්තුවේ ගල්ගොමුව ගමේ අංක 65, 66, 70 සහ 71 දරණ අ. ග. සි. 1 වැනි ඒකාබද්ධ අතිරේකයේ (අංක 66 දරණ අ. ග. සි) ලොට් 90 සහ 90½ වශයෙන් මැණ විස්තර කරණලද පහත සඳහන් ඉඩම් :—

**ලොට් : 90.**

ඉඩමේ නම : වඩුගෙවත්ත,; විස්තර: අවුරුදු 30—35 දක්වා වයසැති රබර් ගස් 2 ක් සහ අවුරුදු 10—12 දක්වා වයසැති නාදුන් ගහක් ඇති රබර් ඉඩම; අයිතිවාසිකම් කියන අය: ඩී. ඒ. පුංචිඅප්පුහාමි, දෙල්ලබොඩ, කරන්ගොඩ සහ ඊ. පුංචිමැණිකා, ඩී. ඒ. ජෝතිහාමි යන දෙදෙනාම, ගල්ගමුව, කරන්ගොඩ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 03.7.

**ලොට් : 90½.**

ඉඩමේ නම : එගොඩකන්දෙවත්ත; විස්තර: අවුරුදු 20—25 දක්වා වයසැති පොල්ගස් 2 ක් ද, අවුරුදු 5—10 දක්වා වයසැති කෝපි ගස් 2 ක් ද, අවුරුද්දක් වයසැති කෙසෙල් ගසක් ද, අවුරුදු 45—50 දක්වා වයසැති කොස් ගසක් ද, අවුරුදු 5—10 දක්වා වයසැති රබර් ගස් 8 ක් ද, අවුරුදු 1—2 දක්වා වයසැති දොඩම් ගස් 6 ක් ද, අවුරුදු 7—8 දක්වා වයසැති දොඩම් ගසක් ද, අවුරුද්දක් වයසැති ලුනුමිදැල්ල ගහක් ද, අවුරුදු 5—10 දක්වා වයසැති පුවක් ගස් 3 ක් සහ කළුගල් වලින් බඳින ලද පාත බැම්මේ බදාම පඩියක කොටසක් ඇති ගෙවත්ත; අයිතිවාසිකම් කියන අය: ඊ. පුංචිමැණිකෙ, ගල්ගමුව, කරන්ගොඩ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 07.7.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ඔක්තෝබර් මස 10 වැනි දින පෙරවරු 10 ට රත්නපුර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1962 ඔක්තෝබර් මස 2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇම්. ඒ. මොහමඩ්,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වර්ෂ 1962 ක්වූ අගෝස්තු මස 10 දින,
රත්නපුර කච්චේරියේදීය.

8-652—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනත (460 වෙනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය : එල්. එම්. 5847

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළයේ, කුකුල්පොතේ වසමේ, මැදගොඩ ගමේ පිහිටි, ඒ. 1121 දරණ මූලික සැලැස්මේ,

**බිම් කට්ටි අංකය : 1.**

ඉඩමේ නම : හොරගොල්ල වත්ත; විස්තර: පොල් ගස් 7 යි, රබර් ගස් 11 යි; අයිතිකරුවෝ: දොරවක, නාත දේවාලයේ ප්‍රධාන භාරකාර, ඩබ්ලිව්. එච්. ඇම්. අමරසේකර, බලහරුව, නියදුරුපොල; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 17.2.

**බිම් කට්ටි අංකය : 2.**

ඉඩමේ නම : රතුඅප්පුගෙවත්ත; විස්තරය: පොල්ගස් 47 යි, පුවක්ගස් 2යි; අයිතිකරුවෝ: දොරවක, නාත දේවාලයේ ප්‍රධාන භාරකාර, ඩබ්ලිව්. එච්. ඇම්. අමරසේකර, බලහරුව, නියදුරුපොල; ප්‍රමාණය: අ. 0, රූ. 2, ප. 14.2.

**එකතුව : අ. 0, රූ. 3, ප. 31.4.**

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වල සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 සැප්තැම්බර් මස 19 වැනි දින පෙරවරු 10 ට කෑගල්ලේ, කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද, 1962 සැප්තැම්බර් මස 12 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දන්විය යුතුයයි ද නියම කරමි.

ලෙනාඩ් පනම්බලන,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කෑගල්ල දිස්ත්‍රික්කය.

කෑගල්ලේ, කච්චේරිය,
1962 අගෝස්තු මස 9 වැනි දාය.

8-626—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: එල්බී/2497.

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර:—

මූලික සිතියම් අංක ඒ 1,963.

පහත සඳහන් ඉඩම්, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව සහ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කපුගම බටහිර ගම්මුලාදෑනි වසමේ ගන්දරවත්ත ගමෙහි පිහිටා ඇත.

කැබැලි අංකය: 1.

ඉඩමේ නම: පාර; ඉඩමේ විස්තර: පාර; අයිතිකම් කියන අයගේ නම් ලිපින: දෙවිනුවර වැල්ලමඩමේ එන්. බී. ධර්මදාස, අම්බලන්ගොඩ මහ අම්බලන්ගොඩ කේ. ටී. ඇස්. ද සිල්වා මහත්මිය සහ යටියන රජයේ දිස්පැන්සරියේ එස්. පී. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහත්මිය; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 34.7.

කැබැලි අංකය: 2.

ඉඩමේ නම: වෙරළුගහකොරටුව, තොටුපලවත්ත; ඉඩමේ විස්තර: ගඩොලින් බැඳි උළු සෙවෙලි කළ ස්ථිර ගොඩනැගිලි දෙකක් ද, බඳින ලද ස්ථිර වැසිකිළියක් ද, මැටියෙන් තණන ලද අතු සෙවිලි කළ තාවකාලික කුස්සියක් ද, මැටියෙන් තනා උළු සෙවිලි කළ තාවකාලික වැසිකිළියක් ද, තාවකාලික පොල් අතු මඩු දෙකක් ද, තාවකාලික ළිං තුනක් ද ඇති අවුරුදු 50ට වැඩි පොල් ඉඩම; අයිතිකම් කියන අයගේ නම් සහ ලිපින: දෙවිනුවර වැල්ලමඩමේ එන්. බී. ධර්මදාස, අම්බලන්ගොඩ මහ අම්බලන්ගොඩ කේ. ටී. ඇස්. ද සිල්වා මහත්මිය සහ යටියන රජයේ දිස්පැන්සරියේ එස්. පී. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහත්මිය; ප්‍රමාණය: අ. 7, රූ. 3, ප. 10.9.

කැබැලි අංකය: 3.

ඉඩමේ නම: තොටුපොලවත්ත; ඉඩමේ විස්තර: අවුරුදු 50 ට වැඩි පොල් ගස් 6කින් යුත් පොල් ඉඩම; අයිතිකම් කියන අයගේ නම් සහ ලිපින: දෙවිනුවර වැල්ලමඩමේ එන්. බී. ධර්මදාස, අම්බලන්ගොඩ මහ අම්බලන්ගොඩ කේ. ටී. ඇස්. ද සිල්වා මහත්මිය සහ යටියන රජයේ දිස්පැන්සරියේ එස්. පී. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහත්මිය සහ දෙවිනුවර ගන්දරවත්තේ එච්. කේ. සෙදිනා, එච්. කේ. සැල්පිනා, එච්. කේ. ජීන්හාමි, එච්. කේ. බබුන්හාමි, එච්. කේ. අනගිහාමි, එච්. කේ. චාර්ලිස් සහ එච්. කේ. දියෝනිස් සහ කැකනදුර පරවාහැර කුලවතී සමරකෝන්; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 13.1.

එකතුව: අ. 8, රූ. 0, ප. 18.7.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 සැප්තැම්බර් මස 15 වැනි දින පෙරවරු 10.00 ට මාතර දිසාපති කාර්යාලයේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 සැප්තැම්බර් 5 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් එම අය විසින් හෝ ඔවුන්ගෙන් ලියවිල්ලකින් බලය ලත් අය හෝ විසින් ඉහත කී අන්දමට මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

තමාගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට ඔප්පු තිරප්පු සහ වෙනත් ලියවිලි වෙතොත් ඒවාද, තමාම, හෝ තමා වෙනුවෙන් පෙනී සිටීමට ලියවිල්ලකින් බලය පැවරුණු නියෝජිතයකු විසින් හෝ විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ප්‍රා. සී. පීටර්ස්,
මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.

මාතර කච්චේරිය.
1962 අගෝස්තු මස 10 වැනි දින දීය.
8-662—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: 3/62/82—ජේ 60/61—එල් 59 (වීඊ).

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර:—

අංක 1105 දරණ අ. ග. සැ. 2 වැනි අතිරේකය. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිල්ලි හත්පත්තුවේ වැඩඹ කෝරළේ දෙල්පද්දන නමැති ගම.

කැබැලි අංකය: 52.

ඉඩමේ නම: පිටකන්දවත්ත; විස්තරය: රබර් වගාව, අවුරුදු 6 ක් වයසැති රබර් ගස් 202 ක් ද, අවුරුදු 2 ක් වයසැති පොල් ගස් 6 ක් ද, අවුරුදු 5 ක් වයසැති පුනුම්දෙල්ල ගස් 1 ක් සහ අවුරුදු 6 ක් වයසැති මාරාගසක් ද ඇත; හිමිකම් කියන අය: සීමාසහිත නෝත් වෙස්ටන් එස්ටේට් සමාගම, ඒජන්තවරු: සීමාසහිත බොසැන්කුවෙට් සහ ස්ක්‍රයින්, තැ. පෙ. අංක 14, කොළඹ, රන්කොත්ගේ ඇබිත්හා, මලන්දෙනිය; ප්‍රමාණය: අ. 1, රූ. 0, ප. 01.

කැබැලි අංකය: 53.

ඉඩමේ නම: පිටකන්දවත්ත; විස්තරය: අවුරුදු 40ක් වයසැති රබර් වගාවක් ද, අඩි පාරවල් 2 ක් ද, මඩු බිමක් ද ඇත; හිමිකම් කියන අය: සීමාසහිත නෝත් වෙස්ටන් එස්ටේට් සමාගම, ඒජන්තවරු: සීමාසහිත බොසැන්කුවෙට් සහ ස්ක්‍රයින්, තැ. පෙ. අංක 14, කොළඹ; ප්‍රමාණය: අ. 20, රූ. 1, ප. 34.

කැබැලි අංකය: 54.

ඉඩමේ නම: දෙනියේපිල්ලෑව; විස්තරය: අවුරුදු 30 ක් වියසැති පොල් ගස් 8 ක් ඇති වත්තක්; හිමිකම් කියන අය: සීමාසහිත නෝත් වෙස්ටන් එස්ටේට් සමාගම, ඒජන්තවරු: සීමාසහිත බොසැන්කුවෙට් සහ ස්ක්‍රයින්, තැ. පෙ. අංක 14, කොළඹ, අයි. අයිදුරුස්, පරගහදෙනිය; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 08.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 සැප්තැම්බර් මස 20 වැනි දින පෙරවරු 9.30 ට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 සැප්තැම්බර් 13 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

එච්. සෝමසුන්දරම්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

කුරුණෑගල කච්චේරිය.
1962 අගෝස්තු මස 7 වැනි දින දීය.
8-692—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ පොහොරබාව වසමේ මියනදෙනිය නැමැති ගමේ පිහිටි, මුළු ප්‍රමාණයෙන් පර්චස් 14.45ක් පමණ විශාල පුස්සැල්ල ගෘෘප් සහ බෝවියමන් ඕයෙ හේනේවත්ත (375 අ.ග.සි. කැබලි 27 සහ 31) නැමැති ඉඩම් කොටස් 3කට මායිම් :—

**1. පුස්සැල්ල ගෘෘප් : (375 අ.ග.සි. කැබලි අංක 27) පර්චස් 7.35ක් පමණ—**

උතුරට : ඇම්. පී. රත්හාමිට අයිති කුඹුර (375 අ.ග.සි කැබලි අංක 20.) ; නැගෙනහිරට. සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : හල්කොටුන්නෙ ඇල.

**2. බෝවියාමන් ඕයේ හේනේවත්ත : (375 අ.ග.සි. කැබලි අංක 31) පර්චස් 4.44ක් පමණ—**

උතුරට : හල්කොටුන්නෙ ඇල ; නැගෙනහිරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස : බස්නාහිරට : ඞී. ජී. මුදලිහාමිට සහ තවත් අය අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක්.

**3 බෝවියාමන් ඕයේ හේනෙ වත්ත : (375 අ.ග.සි. කැබලි අංක 31) පර්චස් 2.66ක් පමණ—**

උතුරට : හල්කොටුන්නෙ ඇල ; නැගෙනහිරට : ඇම්. ජී. විජේහාමි සහ තවත් අය අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක් ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : කැපීමට යන වාරිමාර්ග ඇල.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමති.

යොමු අංකය : ජේ 60/61 එල්. 198.

1962 මාර්තු මස 8 දින,
කොළඹ දී ය.

8-650—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

අංක ඇල්.ඇල්/ඒ 6582.
ජේ 60/61 එෆ්. 32.

## ඉඩම් ලබාගැනීමේ ආඥාපනත (460 පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩපත්තු දකුණේ කිතුල්පෙ ගමේ පිහිටි, අංක 283 දරණ අ : ග : සි : 3 වැනි අතිරේක යේ ලොට් 193 වශයෙන් මැන විස්තර කරන පහත සඳහන් ඉඩම :

ලොට් : 193

ඉඩමේ නම : මීදැල්ලවගුරේ දෙනිය සහ කරපිංචවත්ත ; විස්තර : පාර, අත්හරින ලද කුඹුර සහ රබර් ගස් 59 ක් තිබෙන බඩ් රබර් තවාන ; අයිතිවාසිකම් කියන අය : සී. ලංකාවේ ස෴පරගම් තේ සහ රබර් සමාගම. ඒජන්තවරු :—ජේ. ඇම්. රොබට්සන් සහ සමාගම, පාම් ගාර්ඩන් වතුයාය, රත්නපුර ; ප්‍රමාණය : අ : 0, රූ. : 1, ප : 0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ඔක්තෝබර් මස 10 වැනි දිනපස්වරු 2.30 රත්නපුර කච්චේරියේ දී ස්ථානයේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1962 ඔක්තෝබර් මස 2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම හෝ බුක්ති විශෙෂය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇම්. ඒ. මොහමඞ්,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.
රත්නපුර,

වර්‍ෂ 1962 ක්වූ අගෝස්තු මස 10 දින,
රත්නපුර කච්චේරියේ දීය.

8-651—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

අංක : ඇල් ඇල්/ඒ 6296
ජේ 57/58 ඊ 576

## ඉඩම් ලබාගැනීමේ ආඥාපනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න කෝරළේ කොලොන්නාගම් පත්තුවේ කොලොන්න ගම්මුලාදැනි කොට්ඨාශයේ, කොලොන්න ගමේ අංක 901 දරණ ගම් සිතියමේ 3 වැනි උධෘතයේ ලොට් 220 සිට 222 හා 224 වශයෙන් මැණ විස්තර කරන පහත සඳහන් ඉඩම :—

**ලොට් නො : 220.**

ඉඩමේ නම : අළුත්ගෙදරවත්ත ; විස්තර : අවුරුදු 3-5ක් වයසැති පොල් ගසක් තිබෙන ගෙවත්ත ; අයිතිවාසිකම් කියන අය : කොලොන්නේ සී. පී. බුලත්සිංහල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 24.

**ලොට් නො : 221.**

ඉඩමේ නම : අළුත්ගෙදරවත්ත ; විස්තර : කරත්තපාර ; අයිතිවාසිකම් කියන අය : — ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 14.9.

**ලොට් නො : 222.**

ඉඩමේ නම : අළුත් ගෙදරවත්ත ; විස්තර : අවුරුදු 10-25 දක්වා වයසැති පොල්ගස් 25, අඹගස් එකක්, මාරගස් එකක් සහ මැටි බිත්ති සහිත උළු සෙවිලිකල පාලු ගෙයක් ඇති ගෙවත්ත ; අයිතිවාසිකම් කියන අය : රත්නපුර ගැටන්ගම කේ. ඒ. සයිමොන් සිංඤෝ ; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 01.1.

**ලොට් නො : 224.**

ඉඩමේ නම : ගල්පොත්තෙ හේන ; විස්තර : හේන ; අයිතිවාසිකම් කියන අය : කොලොන්නේ පිටවෙල ගමගේ මුදලිහාමි : ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 06.4.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ඔක්තෝබර් මස 10 වැනි දින පෙරවරු 11ට රත්නපුර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 1962 ඔක්තෝබර් මස 2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇම්. ඒ. මොහමඞ්,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වර්‍ෂ 1962 ක්වූ අගෝස්තු මස 9 දින,
රත්නපුර කච්චේරියේ දීය.

8-627—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

එල්. එම්/1504 : එල්. ඒෆ්/එල්. එල්/166.

## 21 (2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මන්නාරම් සුළු නගර සභා සීමාවේ ඇතුළත පිහිටි පිට කොටුවේ ඒෆ්. පී. එස්. පී. 15 දරණ සැලැස්මේ අංක 10 දරණ බිම් කැබැල්ලෙන් රූඩ් 3/පර්. 13.7ක ප්‍රමාණයෙන් යුත් බිම් කොටසක් සමුපකාර තොග වෙළඳ ආයතන ඩිපෝවක් පිහිටුවීම සඳහා මන්නාරම් ස. තො. වෙළඳ ආයතනය විසින් ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදුදීමට රජය අදහස් කොට තිබේ.

(අ) කාලය : අවුරුදු 30.

(ආ) බද්ද : අවුරුද්දකට රු. 500.

(ඇ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 2ක් ඇතුළතදී මන්නාරමේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි සමුපකාර තොග වෙළඳ ආයතන ඩිපෝවක් තනා නිම කල යුතුයි.

(ඈ) බදු ගන්නන් විසින් මෙම ඉඩම සමුපකාර තොග වෙළඳ ආයතනය තැනීම පිණිස මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ගාමිණී ඊරියගොල්ල,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1962 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, ඉඩම් කොමසාරිස් කාර්යාලයේදීය.

8-519—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

ඉ. කො. අංකය : ඇල්. ඇස්. 5129.
දිසාපතිගේ අංකය : ඇල්/ඇම්ඇන්/ඩබ්/132.

## ආණ්ඩුවේ ඉඩම් රෙගුලාසිවල 21 (2) වන රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මඩකලපුවේ ත්‍රිකුණාමල පාරේ "බෙතල්" හි පදිංචි, ඇස්. ඒ. සෙල්වනායගම් මහතා විසින් මඩකලපු දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනායි පත්තුවේ මඩකලපු නගර සීමාව තුල, තනාඩවන්වෙලි හි පිහිටි, අංක ඒ. 824 දරණ මූලික සිතියමේ අංක 5 දරණ බිම් කැබැල්ලෙන් අඩි 103×13 1/2 පමණ ප්‍රමාණය ඇති කොටසක් ඔහුගේ පුද්ගලික ඉඩමට පිවිසීමේ මග ලෙස පාවිච්චි කිරීමට බදු ඉල්ලා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. අංක ඒ. 824 දරණ මූලික සිතියමේ අංක 5 දරණ බිම් කැබැල්ල මඩකලපුවේ රජයේ විදුහල සඳහා තවත් බිම් කැබලි කිහිපයකුත් සමග රජයට අත්පත් කරගෙන තිබේ. වරිපනම් අංක 36 හා 38 දරණ පුද්ගලික ඉඩම් වලට පිවිසීමේ මග ලෙස මෙම ඉඩම් කැබැල්ල සෙල්වනායගම් මහතා විසින්, එම ඉඩම් කැබැල්ල රජයට පවරා ගැනීමට පෙරින් පටන් පාවිච්චිකර ගෙනැවිත් තිබේ. එසේම මෙම බිම් කැබැල්ලෙ අතරින් මිස වෙන ඉඩම් වලින් ඔහුගේ ඉඩමට පිවිසීමට නොහැකි බැව් පෙනේ. මෙම ඉඩම බදුදීමට පුළුවන. එබැවින් සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට බද්දක් සඳහා කරන ඉල්ලීමට අවසරදීමට අදහස්කර තිබේ :—

(අ) කාලය : අවුරුදු 99 යි.

(ආ) බද්ද : අවුරුද්දකට රු. 12.50 යි.

(ඉ) බදුකරු විසින් මෙම බිම් කැබැල්ල ඔහුගේ ඉඩමට පිවිසීමේ මග සඳහා මිස අන් කිසි කටයුත්තකට පාවිච්චි නොකළ යුතුයි.

3. මෙම ඉඩම බදුදීමට විරුද්ධව වලංගු කරුණු, මෙදින සිට සති හයක් ඇතුළත, මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් මෙම ඉල්ලීම අනුව ඉඩම බදු දෙන්නෙමි.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1962 අගෝස්තු මස 17,
කොළඹ දීය.

8-556—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## තමන්ගේ හෝ රජයේ ඉඩම් හෝ වගාකර ඇති අයවළුන්ගෙන් ඉඩම් සශ්‍රීක කිරීම සඳහා කැඳවනු ලබන ඉල්ලුම් පත්‍රයයි

ප්‍රදේශයේ ඇති ඉඩම් සශ්‍රීක කිරීම සඳහා, දිස්ත්‍රික්කයේ පදිංචි පුද්ගලික ඉඩම් හිමියන්ගෙන් හා රජයේ බදු ඉඩම් හිමියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

ඉල්ලුම් කරුවන් විසින්, තම තමන්ට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය, එහි පිහිටීම හා ඒවා සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවන ආකාරය සඳහන් කළ යුතු ය.

එසේම දිස්ත්‍රික්කයේ තම තමන් විසින් මෙතෙක් සංවර්ධනය කර ඇති ඉඩම්වල සම්පූර්ණ විස්තරයක් ද සැපයිය යුතුයි.

ඉල්ලුම් පත්‍රය, මේ සමග ඇති ආකෘති පත්‍රයේ පරිදි සකස් කළ යුතුය. අවශ්‍ය තවත් වැඩිපුර විස්තර ඇති නම් ඉල්ලුම් පත්‍රය සමග වෙන ලිපියක සඳහන් කර ඉදිරිපත් කළ හැක.

ඉල්ලුම් පත්‍ර 1962.9.28 දින ප. ව. 2ට ප්‍රථම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත ලැබෙන සේ එවිය යුතුය.

ඉල්ලුම් පත්‍රය එවන කවරයේ වම් කෙළවරේ "සංවර්ධනය කිරීම සඳහා ඉඩම්" යන්න සඳහන් විය යුතුය.

ඞී. එම්. ඒ. ස්පෙල්වින්ඩ්,
ත්‍රිකුණාමලයේ දිසාපති.

1962.8.10 වෙනි දින,
ත්‍රිකුණාමලයේ කච්චේරියේදී ය.

### සංවර්ධනය සඳහා ඉඩම් ඉල්ලුම් කිරීම පිණිස පිරවිය යුතු පෝරමය

1. ඉල්ලුම්කරුගේ නම :————.
2. රක්ෂාව :————.
3. දුන් ලිපිනය :————.
4. තමාට අයිති රජයේ ඉඩම් හෝ පුද්ගලික ඉඩම්වල පිහිටීම හා ප්‍රමාණය. (එක කට්ටියකට වැඩිනම්, එක එක කට්ටියේ විස්තර වෙන වෙනම දිය යුතුය. රජයේ ඉඩම් නම් පදිංචි කාලය සඳහන් කළ යුතුය :————.
5. හතර වන ඡේදයේ සඳහන් කළ ඉඩම්වල සංවර්ධිත ස්වභාවය : ————.
6. ඉල්ලුම් කරන ඉඩම (පිහිටීම හා ප්‍රමාණය දියයුතුය :————.
7. ඉඩම සඳහා යෝජනා :————.
   උදා : යෝජිත සංවර්ධන වැඩ පිළිවෙල :————.
8. (1) මෙම වැඩය කිරීම සඳහා මුදල් තිබේද ? එසේ නැතිනම් ඒ සඳහා ඔබ යොදන වැඩ පිළිවෙල කුමක් ද ?
   (2) වැඩය පටන් ගැනීමට අවශ්‍යයයි ඔබ සිතන මූලික මුදල් ප්‍රමාණය :————.
9. එවැනි මූලික මුදලක් අනවශ්‍ය නම් වැඩය කිරීමට ඔබ බලාපොරොත්තුවන්නේ කෙසේ ද ? :————.
10. වෙනත් කරුණු :————.

————
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : 1962 :————.

8-649—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

ඉ. කො. අංකය : 4/10/5042.
දිසාපතිගේ අංකය : එල්ජී. 269.

## රජයේ ඉඩම් පිළිබඳ 21 (2) වන රෙගුලාසිය යටතේ දැන්වීමයි

යාපනය දිසාවේ පච්චිලාපලෙයි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මරුතන්කර්න් ග්‍රාමයේ සොරන්පත්තු-තලයියඩි පාරේ බටහිරින්, 4 වන සැතපුම් කනුව අසල පිහිටි මනල්කාඩු නමැති අක්කර 2ක් පමණවූ රජයේ ඉඩමක්, අයිස් කම්හලක් සඳහා ගොඩනැගිලි තැනීමට පොයින්ට් පේද්‍රුවේ තම්බාසිඩ්ඩිහි ආර්. සපාරත්නම් මහතා බද්දට ඉල්ලා සිටී. අයිස් කර්මාන්ත ශාලාවක් සඳහා බදු ඉල්වන ඉඩමට උතුරින්, බටහිරින් හා දකුණින් රජයේ ඉඩම්ද, නැගෙනහිරින් සොරොන්පත්තු-තලෙයියඩි පාරද මායිම් වේ.

2. ඉල්ලා ඇති කරුණ සඳහා ඉඩම බදු දෙන හැක. මෙම අයිස් කර්මාන්ත ශාලාව ආරම්භ කිරීමෙන් මෙහි අවට මාළු ඇල්ලීමෙන් ජීවිකාව ගෙනයන බොහෝ දෙනෙකුට යහපතක් වෙතැයි වාර්තා කර ඇත. රජයේ සාමාන්‍ය කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට මෙම ඉඩම බදු දීමට රජය අදහස් කෙරේ :—

(අ) කාලය—අවුරුදු 99.

(ආ) බද්ද—අවුරුද්දකට රුපියල් 20යි. සෑම අවුරුදු 30කට වරක් මෙම බදු මුදල ප්‍රතිශෝධනය කරනු ලැබේ. ප්‍රතිශෝධිත බදු මුදල කලින් අවුරුදු 30 තුළ ගෙවනු ලැබූ මුදලට වඩා සියයට 50කට වඩා වැඩි නොකළ යුතුය.

(ඉ) බදු ගන්නා විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 2ක් ඇතුළත යාපනේ දිසාපති විසින් අනුමත කරනු ලබන අයුරින් ඉඩමෙහි අයිස් කර්මාන්ත ශාලාවකට අවශ්‍ය ගොඩනැගිලි තැනවිය යුතුය.

(ඊ) බදු ගන්නා විසින් මෙම ඉඩම අයිස් කර්මාන්ත ශාලාවක් හා ඊට අවශ්‍ය අනෙක් කරුණු සඳහා මිස අන් කටයුත්තකට නොයෙදවිය යුතුය.

3. මෙදින සිට සති හයක් ඇතුළත මෙම බදුදීමට විරුද්ධව කාරණා (වෙතොත්) මා වෙත ලියා නොදැන්වූයේ නම් ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

ඉඩම් කොමසාරිස් කාර්යාලය,
කොළඹ, 1962 අගෝස්තු 7.

8-567—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## තමන්ගේ හෝ රජයේ ඉඩම් හෝ වගාකර ඇති අයවළුන්ගෙන්, ඉඩම් සශ්‍රීක කිරීම සඳහා කැඳවනු ලබන ඉල්ලුම් පත්‍රයයි

ප්‍රදේශයේ ඇති ඉඩම් සශ්‍රීක කිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදිංචි පුද්ගලික ඉඩම් හිමියන්ගෙන් හා රජයේ, බදු ඉඩම් හිමියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ

ඉල්ලුම්කරුවන් විසින්, තම තමන්ට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය එහි පිහිටීම හා ඒවා සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවන ආකාරය සඳහන් කළ යුතුය.

එසේම දිස්ත්‍රික්කයේ තම තමන් විසින් මෙතෙක් සංවර්ධනය කර ඇති ඉඩම්වල සම්පූර්ණ විස්තරයක්ද සැපයිය යුතුයි.

ඉල්ලුම් පත්‍රය, මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයේ පරිදි සකස් කළ යුතුය. අවශ්‍ය තවත් වැඩිපුර විස්තර ඇතිනම් ඉල්ලුම්පත්‍රය සමග වෙන ලිපියක සඳහන්කර ඉදිරිපත් කළ හැක.

ඉල්ලුම් පත්‍රය 1962 සැප්තැම්බර් මස 17 වෙනි දින පස්වරු 2ට ප්‍රථම අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන සේ එවිය යුතුය.

ඉල්ලුම් පත්‍රය එවන කවරයේ වම් කෙළවරේ "අනුරාධපුර දිස්ත්‍රික්කයේ ........................................ ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක .............. දරණ තුලානයෙහි ...................... යන ගමෙන් සංවර්ධන කිරීම සඳහා ඉඩම්" යන්න සඳහන් විය යුතුය.

උපාලි ගුණරත්න,
අනුරාධපුර දිසාපති.

දිසාපති කාර්යාලය,
අනුරාධපුර, 1962. 8. 8.

### සංවර්ධනය සඳහා ඉඩම් ඉල්ලුම් කිරීම පිණිස පිරවිය යුතු ෆෝර්මය

1. ඉල්ලුම්කරුගේ නම :————.
2. රක්ෂාව :————
3. දැන් ලිපිනය :————.
4. තමාට අයිති රජයේ ඉඩම් හෝ පුද්ගලික ඉඩම්වල පිහිටීම හා ප්‍රමාණය. (එක කට්ටියකට වැඩිනම්, එක එක කට්ටියේ විස්තර වෙන වෙනම දිය යුතුය. රජයේ ඉඩම් නම් පදිංචි කාලය සඳහන් කළ යුතුයි.)
5. හතරවන ඡේදයේ සඳහන් කළ ඉඩම්වල සංවර්ධන ස්වභාවය :————.
6. ඉල්ලුම් කරන ඉඩම (පිහිටීම හා ප්‍රමාණය දිය යුතුය) :————.
7. ඉඩම සඳහා යෝජනා :————.
   උදා :—යෝජිත සංවර්ධන වැඩ පිළිවෙල.
8. (අ) මෙම වැඩය කිරීම සඳහා මුදල් තිබේද? එසේ නැතිනම් ඒ සඳහා ඔබ යොදන වැඩ පිළිවෙල කුමක්ද? :————.
   (ආ) වැඩය පටන් ගැනීමට අවශ්‍යයයි ඔබ සිතන මූලික මුදල් ප්‍රමාණය :————.
9. එවැනි මූලික මුදලක් අනවශ්‍යනම් වැඩය කිරීමට ඔබ බලාපොරොත්තු වන්නේ කෙසේද? :————.
10. වෙනත් කරුණු :—

........................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

1962 ........................................,

8-571—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

### තණ බිම්—යාපනය දිස්ත්‍රික්කය

යාපනයේ දිසාපති තැන විසින් හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකු විසින් හෝ තණ බිමක් සේ පමණක් පාවිච්චි කිරීම සඳහා පහත දැක්වෙන උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩමෙහි බද්ද 1962 සැප්තැම්බර් මස 12 වැනිදා පස්වරු 2 ට පිහිටි ස්ථානයේ දී වාර්ෂික බලපත්‍ර උඩදීම සඳහා බදු වෙන්දේසි කරනු ලැබේ.

2. 1948 වේ අංක 18 දරණ ලංකා පුරවැසි පනතෙන් නිරූපනය කරන් පරිදි ලංකා පුරවැසියන්ට පමණක් මෙම වෙන්දේසිය සීමාවේ.

3. වෙන්දේසිය, පටන් ගැනීමට පෙර වෙන්දේසි ඉල්ලුම්කරුවන්ගේ නිර්ව්‍යාජභාවය සහ බදු කොන්දේසි ඉටු කිරීමට පුළුවන් නුපුළුවන්කම ගැන දිසාපතිතැන සොයා බලා, ඒ ගැන සතුටුවිය නොහැකි නම්, එම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් භාරගනු නොලැබේ.

4. සාර්ථක බදුකරු වෙන්දේසිය අවසන් වූ විගසම පළමුවන වර්ෂයේ බද්ද ගෙවිය යුතුයි. එක් එක් බිම් කොටස වෙනුවෙන් ලන්සය රුපි. 20/- කි. රුපි. 20/-ට අඩු ඉල්ලීම් භාරගනු නොලැබේ.

5. වැඩි විස්තර යාපනයේ දිසාපතිතැනගෙන් ලබාගත හැක. බිම් කොටස් සැලැස්මද යාපනය කච්චේරියේදී බලාගත හැක.

එස්. ගුනරත්නම්,
යාපනයේ දිසාපති වෙනුවට.

1962 අගෝස්තු 9 වැනි දින,
යාපනයේ කච්චේරියේ දී ය.

### උපලේඛනය

#### ඉඩම් විස්තරය

යාපනය දිසාවේ, පූනකරි ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ මඩ්ඩුවිල්නාඩු (වෙට්ටුක්කාඩු) ග්‍රාමයේ පිහිටි "ඉලකඩි සෝලෙයි" නැමැති අක්කර 10 බැගින් වූ රජයේ ඉඩම් කැබලි දෙකකි. මෙයට මායිම් මෙසේ යි :—

උතුරට හා නැගෙනහිරට : රජයේ ඉඩම් ; දකුණට : පී. වෙල්ලප්පා මහතාට දී ඇති රජයේ ඉඩමක් ; බටහිරට : වී. කුමාරු මහතාට දී ඇති රජයේ ඉඩමක් හා ජේ. ආර්. සභාරත්නම් මහත්මියගේ ඉඩම්.

මෙම ඉඩම් පිහිටියේ වඩියඩි—සන්ගුපිඩ්ඩි පාරේ සිට වෙට්ටුකාඩු හරහා වැටී ඇති වැලි පාර් දකුණින.

8-691—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## තමන්ගේ හෝ රජයේ ඉඩම් හෝ වගාකර ඇති අයවලුන් ගෙන් ඉඩම් සශ්‍රීක කිරීම සඳහා කැඳවනු ලබන ඉල්ලුම් පත්‍රයයි

ප්‍රදේශයේ ඇති ඉඩම් සශ්‍රීක කිරීම සඳහා, දිස්ත්‍රික්කයේ පදිංචි පුද්ගලික ඉඩම් හිමියන්ගෙන් හා රජයේ බදු ඉඩම් හිමියන්ගේන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන් විසින්, තම තමන්ට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය. එහි පිහිටිම හා ඒවා සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවන ආකාරය සඳහන් කළ යුතුය.

3. එසේම දිස්ත්‍රික්කයේ තම තමන් විසින් මෙතෙක් සංවර්ධනය කර ඇති ඉඩම්වල සම්පූර්ණ විස්තරයක්ද සැපසිය යුතුයි.

4. ඉල්ලුම් පත්‍රය මේ සමග ඇති ආකෘති පත්‍රයේ පරිදි සකස් කළ යුතුය. අවශ්‍ය තවත් වැඩිපුර විස්තර ඇති නම් ඉල්ලුම් පත්‍රය සමග වෙන ලිපියක සඳහන් කර ඉදිරිපත් කළ හැක.

5. ඉල්ලුම් පත්‍ර 1962 සැප්තැම්බර් මස 28 වෙනි දින ප. ව. 2 ට ප්‍රථම දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත ලැබෙන සේ එවිය යුතුය.

6. ඉල්ලුම් පත්‍රය එවන කවරයේ වම් කෙළවරේ "සංවර්ධනය කිරීම සඳහා ඉඩම්" යන්න සඳහන් විය යුතුය.

ටී. ඒ. එල්. ලුඩවොයික්,
මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1962 අගෝස්තු මස 8 වෙනි දින,
මඩකලපු දිසාපති කාර්යාලයේ දීය.

### සංවර්ධනය සඳහා ඉඩම් ඉල්ලුම් කිරීම පිණිස පිරවිය යුතු ෆෝර්මය

1. ඉල්ලුම්කරුගේ නම :————.
2. රක්ෂාව :————.
3. ඇන් ලිපිනය :————.
4. තමාට අයිති රජයේ ඉඩම් හෝ පුද්ගලික ඉඩම්වල පිහිටීම හා ප්‍රමාණය. (එක කට්ටියකට වැඩිනම්, එක එක කට්ටියේ විස්තර වෙන වෙනම දිය යුතුය. රජයේ ඉඩම් නම් පදිංචි කාලය සඳහන් කළ යුතුය) :————.
5. 4 වන ඡේදයේ සඳහන් කළ ඉඩම්වල සංවර්ධන ස්වභාවය :————.
6. ඉල්ලුම් කරන ඉඩම (පිහිටීම හා ප්‍රමාණය දිය යුතුය) :————.
7. ඉඩම සඳහා යෝජනා :————.
   උදා.—යෝජිත සංවර්ධන වැඩ පිළිවෙල :————.
8. (2) මෙම වැඩය කිරීම සඳහා මුදල් තිබේද ? :————.
   එසේ නැතිනම් ඒ සඳහා ඔබ යොදන වැඩ පිළිවෙල කුමක්ද ? :————.
   (3) වැඩය පටන් ගැන්මට අවශ්‍යයයි ඔබ සිතන මූලික මුදල් ප්‍රමාණය :————.
9. එවැනි මූලික මුදලක් අනවශ්‍ය නම් වැඩය කිරීමට ඔබ බලාපොරොත්තු වන්නේ කෙසේද———— ?
10 වෙනත් කරුණු :————.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : 1962............,

8-625—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

---

## සත්ව පාලනය සඳහා ද ආහාර සහ වාණිජ වැවිලි වගා කිරීම සඳහාද වියලි කලාපයේ ඉඩම් බෙදාදීම

ප්‍රධාන වශයෙන් පහත සඳහන් දිස්ත්‍රික්කයන් හි, එනම් :—

(1) හම්බන්තොට දිස්ත්‍රික්කය.

(2) මොණරාගල දිස්ත්‍රික්කය.

(3) බදුල්ල දිස්ත්‍රික්කයේ වියලි කලාපීය තීරය.

(4) අම්පාරේ දිස්ත්‍රික්කය

(5) මඩකලපුව දිස්ත්‍රික්කය.

(6) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

(7) පොලොන්නරුව දිස්ත්‍රික්කය.

(8) අනුරාධපුර දිස්ත්‍රික්කය.

(9) පුත්තලමේ දිස්ත්‍රික්කය (හලාවතට උතුරින්).

(10) කුරුණෑගල දිස්ත්‍රික්කය. (කුරුණෑගලට උතුරින්).

(11) වවුනියා දිස්ත්‍රික්කය.

(12) මන්නාරම් දිස්ත්‍රික්කය.

(13) යාපනේ දිස්ත්‍රික්කය, සහ

(14) රත්නපුර දිස්ත්‍රික්කයේ වියලි කලාපීය තීරයෙහි

පිහිටි වියලි කලාපීය ප්‍රදේශවල ඉඩම් සංවර්ධනය කිරීම බාරගත හැකි අයගෙන්ද, සමාගම්, සමූපකාර සමිති සහ වෙනත් සමිති වලින්ද වෙනත් කටයුතු අතර පහත දක්වෙන කාර්යන් කිරීමට ඉඩම් බදුදීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

(ඒ) පාළුවී ඇති වැවක් යටතේ ජලය සපයා ගැනීමෙන් වී සහ වෙනත් වගාකල හැකි වැවිලි දියුණු කිරීම. වැව ප්‍රතිසංස්කරණය ඉල්ලුම්කරු විසින් කළ යුතුය.

(බී) ආහාර හෝ වාණිජ වැවිලි දියුණු කිරීම

(සී) පලතුරු ගස් වැවීම

(ඩී) කජු වැවීම

(ඊ) සත්ව පාලනය

ඉහත සඳහන් ප්‍රදේශවල ගොවීන් සහ මධ්‍යම පංතික ලාංකිකයින් විසින් දියුණු කළ හැකි ඉඩම් ද. ප්‍රාදේශිය අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අවශ්‍ය වෙනත් ඉඩම් ද සාමාන්‍යයෙන් බෙදා දෙනු නොලැබේ. තෙත් කලාපීය පෙදෙස්වල පිහිටි රජයේ ඉඩම් ද බෙදාදිය නොහැක.

2. යටත් පිරිසෙයින් අක්කර 50ක් හෝ ඊට වැඩි ගණනක් ඉල්ලුම් කළ යුතු අතර සංවර්ධන වැඩ පිළිවෙල පිළිබඳ සියළුම විස්තරද, ඒ සඳහා තිබෙන මුදල් ප්‍රමාණයද, යෝජිත ව්‍යාපාරයෙන් කොතරම් ප්‍රතිඵල ලබාගත හැකිද නැතහොත් එය කොතරම් දුරට සාර්ථකවේද යනාදිය ගැන අවශ්‍ය විස්තර ඉල්ලුම් පත්‍රවල සඳහන් විය යුතුය.

3. තමන් ලබාගැනීමට කැමති ඉඩම් වියලි කලාපයේ කවර ප්‍රදේශයක පිහිටා තිබේද යන්න ඉල්ලුම්කරුවන් සඳහන් කළ යුතුය. එසේම යම් හේතුවක් නිසා තමන් කැමති ඉඩම් බෙදා දිය නොහැකි නම් ඉල්ලුම්කරුවන් කැමති වෙනත් ප්‍රදේශ ද ඉල්ලුම් පත්‍රවල සඳහන් විය යුතුය.

4. අවුරුදු 50 දක්වා මේ ඉඩම් බදු දෙනු ලැබේ. තවත් අවුරුදු 50ට නොවැඩි කාලයක් සඳහා එම බද්ද දෙවනුව දිගු කරගත හැක. ව්‍යාපාරයේ තරාතිරම ගැන සලකා බලා ඉඩම් වෙනුවෙන් ප්‍රථම අවුරුදු 5 සඳහා ගෙවිය යුතු බදු මුදල් කපා හැරිය හැක.

5. ඉඩමේ අසංවර්ධිත වටිනාකමින් සියයට 4ට නොවැඩි බදු මුදලක් නියම කරනු ඇත. මෙම බදු මුදල වර්ෂයකට එක් එක් අක්කරයකට සාමාන්‍යයෙන් රු. 4 සිට රු. 10 දක්වා ඇති මුදලක් විය හැක.

6. අය බදු ගෙවීම පිළිබඳ සහන කීපයක් දෙනු ඇත. නුදුරු අනාගතයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන යෝජිත සවදේශීය ආදායම් පනතෙහි මෙම සහන ඇතුළත් කරනු ඇත. අවුරුදු 5ක කාලයක් මෙම ඉඩම්, ඉඩම් ආදායම් බද්දෙන් නිදහස් කෙරෙනු ඇත.

7. සියළුම ඉල්ලුම් පත් 1962 සැප්තැම්බර් මස 14 වෙනි සිකුරාදා අ. භා. 2 පෙර ඉඩම් කොමසාරිස්තුමාට ලැබිය යුතුය.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්.

ඉඩම් කොමසාරිස් කාර්යාලය,
මහලේකම් ගොඩනැගිල්ල,
කොළඹ, 1962.8.10.

8-694—62.8.17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

## තමන්ගේ හෝ රජයේ ඉඩම් හෝ වගාකර ඇති අයවළුන්ගෙන් ඉඩම් සශ්‍රීක කිරීම සඳහා කැඳවනු ලබන ඉල්ලුම් පත්‍රයයි

ප්‍රදේශයෙහි ඇති ඉඩම් සශ්‍රීක කිරීම සඳහා, දිස්ත්‍රික්කයේ පදිංචි පුද්ගලික ඉඩම් හිමියන්ගෙන් හා රජයේ බදු ඉඩම් හිමියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන් විසින්, තම තමන්ට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය, එහි පිහිටීම හා ඒවා සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන ආකාරය සඳහන් කළ යුතුය.

3. එසේම දිස්ත්‍රික්කයේ තම තමන් විසින් මෙතෙක් සංවර්ධනය කර ඇති ඉඩම්වල සම්පූර්ණ විස්තරයක්ද සැපයිය යුතුයි.

4. ඉල්ලුම් පත්‍රය, මේ සමග ඇති ආකෘති පත්‍රයේ පරිදි සකස් කළ යුතුය. අවශ්‍ය තවත් වැඩිපුර විස්තර ඇති නම් ඉල්ලුම් පත්‍රය සමග වෙන ලිපියක සඳහන් කර ඉදිරිපත් කළ හැක.

5. ඉල්ලුම් පත්‍ර 62.9.17 දින ප.ව. 2 ට ප්‍රථම කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන සේ එවිය යුතුය.

6. ඉල්ලුම් පත්‍රය එවන කවරයේ වම් කෙළවරේ "සංවර්ධනය කිරීම සඳහා ඉඩම්" යන්න සඳහන් විය යුතුය.

ඊ. ඇම්. විජේනායක,
කුරුණෑගල දිසාපති.

1962 අගෝස්තු 9 වැනි දින,
කුරුණෑගල කච්චේරියේ දීය.

### සංවර්ධනය සඳහා ඉඩම් ඉල්ලුම් කිරීම පිණිස පිරවිය යුතු ෆෝරමය

1. ඉල්ලුම්කරුගේ නම :————.
2. රක්ෂාව :————.
3. ඇඩ්‍ලිපිනය :————.
4. තමාට අයිති රජයේ ඉඩම් හෝ පුද්ගලික ඉඩම්වල පිහිටීම හා ප්‍රමාණය. (එක කට්ටියකට වැඩිනම්, එක එක කට්ටියේ විස්තර වෙන වෙනම දිය යුතුය. රජයේ ඉඩම් නම් පදිංචි කාලය සඳහන් කළ යුතුය) :————.
5. 4 වන ඡේදයේ සඳහන් කළ ඉඩම්වල සංවර්ධන ස්වභාවය : ————.
6. ඉල්ලුම් කරන ඉඩම (පිහිටීම හා ප්‍රමාණය දිය යුතුය) :————.
7. ඉඩම සඳහා යෝජනා—
   උදා : යෝජිත සංවර්ධන වැඩ පිළිවෙල :————.
8. (2) මෙම වැඩය කිරීම සඳහා මුදල් තිබේද? එසේ නැත් නම් ඒ සඳහා ඔබ යොදන වැඩ පිළිවෙල කුමක්ද? :————.
   (3) වැඩය පටන් ගැන්මට අවශ්‍යයයි ඔබ සිතන මූලික මුදල් ප්‍රමාණය :————.
9. එවැනි මූලික මුදලක් අනවශ්‍ය නම් වැඩය කිරීමට ඔබ බලාපොරොත්තු වන්නේ කෙසේද? :————.
10. වෙනත් කරුණු :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : 1962 :————.

8-647—62. 8. 17 දින අංක 13,263 දරන ගැසට් පත්‍රය

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි